# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2308/26 - 2022 දෙසැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **"2022 අංක 22 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. 2022 සැප්තැම්බර් මස 16 දිනැති අංක 2297/79 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 15 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මගින් සංශෝධිත, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි, මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. 2022 සැප්තැම්බර් මස 16 දිනැති අංක 2297/79 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 15 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල අංක 5 රෙගුලාසියෙන් අවසර දී ඇති පරිදි කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව ලියාපදිංචි කුකුළු ආහාර නිෂ්පාදකයින් විසින්, විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කරනු ලබන, කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන **බඩඉරිඟු (එච්. එස්. 1005.90.00) සහ සෝයා බෝංචි ආහාර (එච්. එස්. 2304.00.00)** තොග, ශ්‍රී ලංකාවේ වරාය/ගුවන්තොටුපළ වෙත පැමිණෙන දිනය 2022 දෙසැම්බර් මස 31 දක්වා දීර්ඝ කරනු ලැබේ.

4. ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉහත අංක 3 දරන රෙගුලාසි උල්ලංඝනය කරමින් සිදුකරන ඕනෑම ආනයනයක් සම්බන්ධයෙන් කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් උපදෙස් ලබා ගත යුතුය.

1A - PG 6078 — 406 (2022/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*